පොදු චක්‍රලේඛ ලිපි අංක :- 02 - 32 / 2014

මගේ අංකය :- 1A/G/01/2014

සෞඛ්‍ය අමාත්‍යාංශය,

"සුවසිරිපාය",

385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,

කොළඹ 10.

2014.12.017

රේඛීය අමාත්‍යාංශය යටතට ගැනෙන සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන් හා ආයතන ප්‍රධානීන්,

අතුරු වෛද්‍ය සේවයට අයත් තනතුරුවල පුහුණු පාසල්වලට

ආචාර්ය බඳවා ගැනීම.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතුරු වෛද්‍ය සේවාවට අයත් පුහුණු පාසල් ආචාර්ය තනතුරු සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන රෝහල්/ ආයතන වල සේවයේ නියුතු එම සේවාවන්ට අයත් පහත සඳහන් තනතුරුවල සේවය කරන අය අතුරින් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සමඟ අමුණා ඇති ආදර්ශ ආකෘතියට පිළියෙල කරගත් අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මඟින් ..... දිනට පෙර අධ්‍යක්ෂ (පාලන) 02, සෞඛ්‍ය අමාත්‍යාංශය, සුවසිරිපාය, 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 වෙත ලැබීමට සැලැස්විය යුතුය.

- ❖ අක්ෂි තාක්ෂණාවේදී (MT-06)-2006 A
- ❖ කිට විද්‍යා සහකාර (MT-06)-2006 A
- ❖ බන්තු රේඛන ශිල්පී (MT-04)-2006 A
- ❖ විද්‍යුත් නිකර්ෂන රේඛන සටහන් කරු (MT-04)-2006 A
- ❖ මහජන සෞඛ්‍ය පරීක්ෂක (MT-05)-2006 A

01. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්**

I. අදාල තනතුරෙහි I ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ II ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතුයි.

II. ඉගැන්වීමේ දක්ෂතාවය හා ඉංග්‍රීසි භාෂාව මනා ලෙස හැසිරවීම පිළිබඳ ප්‍රවීණතාවය ලබා තිබීම.

III. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් නිලධාරියකු විය යුතුය.

02. **වයස් සීමාව**

බඳවා ගැනීම් සිදු කරනුයේ අතුරු වෛද්‍ය සේවයට අයත් තනතුරුවල දැනටමත් සේවයේ නියුක්ත ජ්‍යෙෂ්ඨනිලධාරීන් අතුරින් බැවින් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

03. වැටුප් පරිමාණය

2006.04.25 දිනැති රා.ප.ව. 06/2006 ට අනුකූලව සේවා ගණයට අදාළ වැටුප් සේත අංක සහ වැටුප් පරිමාණය පහත පරිදි වේ.

- (MT-06)- 2006 A රු.15,440-5×180-5×240-11×320-20×360-28,260
- (MT-05)-2006 A රු.15,260-6×180-4×240-11×320-20×360-28,020
- (MT-04)-2006 A රු.15,080-7×180-3×240-11×320-20×360-27,780

04. බඳවා ගැනීමේ ක්‍රමය

සුදුසුකම් ලත් අයදුම්කරුවන් 05 හි දැක්වෙන ලකුණු දීමේ ක්‍රමය පදනම් කරගත් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනේ.

05. ලකුණු දීමේ ක්‍රමය

1 ජ්‍යෙෂ්ඨත්වය

අදාළ ආචාර්ය තනතුරේ එක් වසරකට ලකුණු 05 බැගින් (උපරිම ලකුණු 30)

2. ඉගැන්වීමේ පලපුරුද්ද

එක් වසරකට ලකුණු 02 බැගින් (උපරිම ලකුණු 20)

3. උසස් අධ්‍යාපන සුදුසුකම්

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් අදාළ තනතුරේ උපාධිය හෝ පාඨමාලාවේ අදාළ විෂයන් සම්බන්ධ වූ උපාධියක් සඳහා - ලකුණු 10

අදාළ තනතුරේ ඩිප්ලෝමාවක් සඳහා - ලකුණු 02

(උපරිම ලකුණු - 20)

4. විශේෂ කුසලතාවයන්

සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිගත් විශේෂ පුහුණු ඉගැන්වීම් පිළිබඳව පාඨමාලා වැනි දෑ

එක් කුසලතාවයක් සඳහා ලකුණු 01 බැගින් (උපරිම ලකුණු 05)

5. ඉංග්‍රීසි භාෂා දැනුම (උපරිම ලකුණු 20)

අ.පො.ස. (සා/පෙළ) විශිෂ්ඨ සම්මානයක් සඳහා - ලකුණු 06

අ.පො.ස. (සා/පෙළ) සම්මාන සාමාර්ථයක් සඳහා - ලකුණු 05

අ.පො.ස. (සා/පෙළ) සාමාන්‍ය සාමාර්ථයක් සඳහා - ලකුණු 04

ඉංග්‍රීසි භාෂා දැනුම හා ප්‍රවීණතාවය පිළිගත් වෙනත් සුදුසුකම් සඳහා (සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිගත් ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා - ලකුණු 05

6. සම්මුඛ පරීක්ෂණය සඳහා - ලකුණු 05

5. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය (උපරිම ලකුණු - 20)

6. සේවා කොන්දේසි

i. මෙම තනතුර ස්ථිරය. දායක විශ්‍රාම වැටුප් අරමුදල යටතේ දායක විශ්‍රාම වැටුපකට හිමිකම් ඇත.

<u>ව්‍යතිරේකය:-</u>

2003.01.01 දිනට පෙර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දැරූ අයෙකු මෙම තනතුරට බඳවා ගනු ලැබුවහොත් එවැනි අයෙකුට තවදුරටත් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපක් සඳහා හිමිකම් ඇති අතර වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක ගෙවිය යුතුය.

ii. ආයතන සංග්‍රහයේ දෙවන පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්ති අදාළ වේ.

7. i. ඉහත අංක 01 හා 02 යටතේ සනාථ කළ යුතු ලිපිලේඛන කිසිවක් වෙතොත් ඒවා අයදුම්පතට ඇමිණිය යුතුය.

ii. අවශ්‍ය වූ විටෙක ලිපිලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින් ගැන සලකා බලනු නොලැබේ.

iii. අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වෛද්‍ය වයි.ඩී. නිහාල් ජයතිලක,

ලේකම්,

සෞඛ්‍ය අමාත්‍යාංශය.